# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,950 — 1918ක්වූ ජූනි මස 21වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කරණලද ප්‍රකාශපත්‍රයයි.

මහාබ්‍රිතාන්‍ය සහ අයර්ලන්තය යන එක්සත් රාජ්‍යයේද, මුහුදින් එතර රාජ්‍යවලද රජවූ සමය සංරක්‍ෂක පස්වෙනි ජෝර්ජ් නාමෝපලක්‍ෂිත මහාරාජෝත්තමයාණන්වන්වහන්සේගේ නාමයෙන්,

සෙන්ට් ජෝර්ජ් සහ සෙන්ට් මයිකල් යන අතිවිශිෂ්ට පඩ්ක්තියේ සාමාජික ධුරන්ධර යටත් ප්‍රදේශ ඇතුලත්
ලංකාද්වීපයේ වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් දෙනලද

ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

ආර්. ඊ. ස්ටබ්ස්.

ගම්බද පාඨශාලා සම්බන්ධ 1907කේ ආඥාපණතේ 19වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ පාඨශාලා කාරක සභාව විසින් සාදනලදුව කාරක මන්ත්‍රණ සභා ප්‍රාප්ත ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් ස්ථිර කරණලැබ 1910යේ පෙබරවාරි මස 17වෙනි දින දරණ ප්‍රකාශපත්‍රයේ මාර්ගයෙන් 1910යේ පෙබරවාරි මස 25වෙනි දින නොම්මර 6,356 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධකරණලද අතුරුපණත් අතුරෙන් 2වෙනි අතුරුපණත, ගම්බද පාඨශාලා ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණයකළ 1917කේ 34වෙනි ආඥාපණතේ 3 (b) යන වගන්තියේ ප්‍රකාර එම කොමිටිය විසින් ප්‍රතිසංස්කරණය කරනලදී.

තවද වැඩබලන ආණ්ඩුකාර ධුරන්ධර අපකෙරෙහි එම 1907කේ ගම්බද පාඨශාලා ආඥාපණතේ 20 (2) යන වගන්තියෙන් පවරණලද බලය සහ කාරක මන්ත්‍රණ සභාවේ අනුශාසනාවත් ඇතුව මෙහි පහත දක්වන එම අතුරුපණත අළුත් වැඩියාකරණලද ආකාරයට ස්ථිරකරණ බව සියලුදෙනාම මෙයින් දැනගතයුතුයි.

අපගේ ස්වාමීන්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය දහඅටක්වූ ජූනි මස දහතුන්වෙනි දින ලංකාද්වීපයේ කොළඹදී දෙවාවදුරණ ලද්දේය.

උතුමාණන්වහන්සේගේ අණ පරිද්දෙන්,

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වමහ.

අප මහරජාණන් දෙවියෝ රකිත්වා.

---

ඉගැන්වීම පිණිස පාඨශාලාවට එවියයුතු ළමෝ.—වයස අවුරුදු 6ට අඩුනොවූද, 14ට වැඩිනොවූද සෑම පිරිමි ළමයින්ගේ මව්පියන් විසින්ද, වයස අවුරුදු 6ට අඩුනුවූද 12ට වැඩිනොවූද සෑම ගැණු ළමයින්ගේ මව්පියන් විසින්ද නොහොත් මහමදුගම්කාර සහ දෙමළ ගැණු ළමයෙක්වූකල වයස අවුරුදු 6ට අඩුනොවූද 10ට වැඩිනොවූද සෑම එවැනි ගැණු ළමයින්ගේ මව්පියන් විසින්ද, ඒ පිරිමි ළමයාට හෝ ගැණු ළමයාට ඉගෙනීම පිණිස වෙන සෑහෙන තරමටද නිසියාකාරයටද ඉගැන්වීම කරන්ට කටයුතු සලස්වාගෙන තිබ්බිනම්, එක්කෝ එසේ නොකිරීම පිණිස සැලකියයුතු හේතුවක් ඇත්නම් මිස ඒ පිරිමි ළමයා නොහොත් ගැණු ළමයා මීට යාකර තිබෙන ලේඛණයේ පෙණෙන පාඨශාලාවකට යැවියයුතුයි. නුමුත් පදිංචි ස්ථානයේ සිට හැතැප්ම 2ක ප්‍රමාණය ඇතුළත ගැණු ළමයින්ට වෙනම පාඨශාලාවක් නැත්නම් ගැණු ළමයෙක් පාඨශාලාවට යැවීම ඕනෑ කරන්නේ නැත.

---

මහාබ්‍රිතාන්‍ය සහ අයර්ලන්තය යන එක්සත් රාජ්‍යයෙහිද, මුහුදින් එතර බ්‍රිතාන්‍ය රාජ්‍යවලද, රාජාභිෂේකලත් සමය සංරක්‍ෂක නෛකශ්‍රීන් විරාජමානවූ පස්වෙනි ජෝර්ජ් රජ්ජුරුවන්වහන්සේගේ නාමයෙන්.

සෙන්ට් මයිකල් සහ සෙන්ට් ජෝර්ජ් යන අතිවිශිෂ්ට පඩ්ක්තියේ කොම්පැනියන්වූද, ලඞ්කාද්වීපයේ සහ ඊට
අයත් ප්‍රදේශවල ආණ්ඩුකාර ධුරන්ධරවූද රෙජිනෝල්ඩ් එඩ්වඩ් ස්ටබ්ස්
උතුමාණන්වහන්සේ විසින් දෙවාවදුරණලද

ප්‍ර කා ශ ප ත්‍ර ය යි.

ආර්. ඊ. ස්ටබ්ස්.

1917කේ අංක 8 සහ 34 දරණ ආඥාපණත්වලින් අලුතුකරණලැබූ 1907කේ අංක 8 දරණ ග්‍රාම පාඨශාලා ආඥාපණතේ 19 සහ 20 (1) වගන්තිවලින් නැගෙනහිර දිසාවේ තිරිකුනාමලේ දිස්ත්‍රික් පාඨශාලා සභාවට පවරාතිබෙන බලය කරණකොටගෙණ මීට අමුනා තිබෙන ෂැඩ්‍යුල්පත්‍රයෙහි දක්වා තිබෙන අතුරුපනත් එකී සභාව විසින් සාදනලදී.

එබැවින් ලංකාද්වීපයේ එකී ආණ්ඩුකාරතුමා වන අපවෙත ඉහතකී ආඥාවේ 20 (2) වෙනි කාණ්ඩයෙන් පවරාතිබෙන බලය කරණකොටගෙණ කාරක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රණ පිට මේ සමග තිබෙන ආංධෝලිපියෙහි දක්වා තිබෙන එකී අතුරුපනත් අප විසින් මෙයින් ස්ථිරකරණලද බව සියලුදෙනා විසින් දැනගතයුතුයි.

එබැවින් එකී අතුරුපනත් මෙහි දක්වන දිනේ පටන් වලංගුවන බව අප විසින් ප්‍රකාශකොට ප්‍රසිද්ධකරන්ට යෙදුනා ඇත.

අපගේ ස්වාමින්වහන්සේගේ වර්ෂයෙන් එක්දහස් නවසිය දහඅටක්වූ ජූනි මස දහතුන්වෙනි දින මෙම ලංකාද්වීපයේ කොළඹදී දෙවාවදුරණලද්දේය.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් විසින්.

අප මහරජාණන් දෙවියෝ රකිත්වා.

---

1917තේ අංක 8 සහ 34 දරණ ආඥාපනත්වලින් අමුතුකරනලද 1907තේ ග්‍රාම පාඨශාලා ආඥාවේ 19 සහ 20වෙනි වගන්තිවල ප්‍රකාර තිරිකුණාමලේ දිස්ත්‍රික් පාඨශාලා සභාව විසින් මීට අමුනා තිබෙන "ඒ" අක්ෂරය දරණ ෂැඩුල්පත්‍රයෙහි පෙනෙන භූමිභාගයට සාදනුලැබූ අතුරුපනත්.

1. මේ අතුරුපනත්වල පෙනෙන "පිරිමි ළමයා" "ගැණු ළමයා" සහ "ළමයා" යන පදවලින් ප්‍රකාශවන්නේ මීට ඈකර තිබෙන "ඒ" අක්ෂරය දරණ ෂැඩුල්පත්‍රයෙහි විස්තරකර තිබෙන භූමිභාගය තුළ පදිංචිව සිටින පිරිමි ළමයෙක් හෝ ගැණු ළමයෙක් හෝ ළදරුවෙක්ය.

"මව්පිය" යන කීමට ආරක්ෂාකාරයෙක්ද, ළමයාගේ භාරකාරකම ඒකාන්තයෙන්ම ඇති අයද ඇතුළත්වෙති.

"කෝඩ්" නම් "ව්‍යවස්ථා පොත" යන පදයෙන් ප්‍රකාශවන්නේ ගරුතර ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රණ සභාවෙහිදී ඒත්තුගන්නාලද ආණ්ඩුවෙන් ආධාර ලබන පාඨශාලා සම්බන්ධව එවකට පවතින ව්‍යවස්ථාපොතය.

"පාඨශාලාවට පැමිණීම" යන පාඨයෙන් හැඟෙන්නේ "කෝඩ්" නම් ව්‍යවස්ථා පොතේ ප්‍රකාර පැමිණීමේ ලේඛන යක සටහන්කළහැකි පැමිණීමේ සම්පූර්ණ කාලය හැටියට ව්‍යවස්ථා පොතේ නියමකොට තිබෙන කාලයේ තුළ පැමිණීමයි.

"ප්‍රදේශාධිකාරී" යන පදයෙන් හැඟෙන්නේ තිරිකුණාමලේ දිස්ත්‍රික් පාඨශාලා සභාවය.

"පාඨශාලා" යන පදයෙන් ප්‍රකාශවන්නේ මීට අමුනා තිබෙන 'බී' අක්ෂරය දරණ ෂැඩුල්පත්‍රයෙහි නියම්කර තිබෙන පාඨශාලාවක්ය.

"ළමයෙකුගේ ඉගණීම පිණිස ප්‍රමාණවූද යෝග්‍යවූද පිළිවෙළ යොදාගැණීම" සහ "සැලකියයුතු හේතුව" යන පාඨයන්ගෙන් ප්‍රකාශවන්නේ 1907තේ ග්‍රාම පාඨශාලා ආඥාපනතේ 20 (1) (බී) වගන්තියේ පැහැදිලිකර තිබෙන අර්ථයමේ.

"පාඨශාලා පරීක්ෂකතැන" යන පදයේ අර්ථයනම් ගරුතර ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පත්කරණලැබූ පාඨශාලා පරීක්ෂක කෙනෙක්ය.

2. වයස අවුරුදු හයට අඩුනුවූ දහහතරට වැඩිනුවූ සෑම පිරිමි ළමයින්ගේද වයස අවුරුදු හයට අඩුනුවූ දොළහට වැඩිනුවූ සෑම ගැණු ළමයින්ගේද වයස අවුරුදු හයට අඩුනුවූ දහයට වැඩිනුවූ සෑම මහමදගම්කාර සහ දෙමළ ගැණු ළමයින්ගේද මව්පියන් විසින් ඔවුනොවුන්ගේ ළමයින්ගේ ඉගණීම සම්බන්ධව ප්‍රමාණවූද යෝග්‍යවූද පිළිවෙළක් යොදා නැත්නම් නොහොත් පාඨශාලාවට නොපැමිණ සිටීමට සැලකියයුතු හේතුවක් නැත්නම් එකී පිරිමි ළමයා නොහොත් ගැණු ළමයා 'බී' අක්ෂරය දරණ ෂැඩුල්පත්‍රයේ පෙනෙන පාඨශාලාවකට යැවිය යුතුයි. එසේවුවත් හැතැප්ම තුනකට වැඩිවූ දුරක සිටින ගැණු ළමයෙක් පාඨශාලාවට යැවීමට බලනොකරණු ලැබේ.

සැලකියයුතුවූද සෑහෙන්නාවූද යම්කිසි හේතුවක් නිසා අවුරුදු දොළහට වැඩි වයසැති පිරිමි ළමයෙක් පාඨශාලාවට පැමිණීමෙන් සම්පූර්ණයෙන්ම හෝ කලකට නිදහස්කිරීමට දිස්ත්‍රික් පාඨශාලා සභාවේ ප්‍රධානතුමාට බලය තිබේ.

3. සෑම පිරිමි ළමයින් හෝ ගැනුළමයින් පාඨශාලාවට පැමිණ සිටියයුතු කාලය නම් ඔවුන්ගේ වයසට සමාන වයසැති ළමයින්ගේ ඉගණීම පිණිස පාඨශාලාව විවෘත කර තිබෙන මුළු කාලය වේ.

4. එසේවුවත් (අ) 1907තේ ග්‍රාම පාඨශාලා ආඥාවේ 21 ($d$) වගන්තියෙහි ප්‍රකාර පාඨශාලාවෙහි අගම් ධර්මය උගන්වන කාලය තුළ ළමයින්ට මගඇර ඉදීමට තහනමක් නැත.

(ආ) යම් ළමයෙකුගේ මව්පියන්ට අයිති ආගමේ කටයුතු පැවැත්වීම පිණිස සම්පූර්ණයෙන් වෙන්කර තිබෙන දවසක පාඨශාලාවට පැමිණීමට ඒ ළමයාට බලනොකරණුලැබේ.

5. එසේවුවත් නිරන්තරවම දිස්ත්‍රික් පාඨශාලා සභාවේ ප්‍රධානතුමාට පිළිගතහැකි පරිදි ශුභසිද්ධිය ගෙනදෙනාකාර රක්ෂාවක යෙදී සිටින අවුරුදු 10ටත් 14ටත් අතරේ වයසැති පිරිමි ළමයෙක් පස්වෙනිවූ ප්‍රමාණයට නියමකර තිබෙන පාඩම් විභාගයෙන් කියවීමෙන්ද, ලිවීමෙන්ද ගණිතයෙන්ද සමර්ථවූ බවටද, එසේම රක්ෂාවක යෙදී සිටින අවුරුදු 10ටත් 12ටත් අතරේ වයසැති ගැණු ළමයෙක් 'බී' අක්ෂරය දරණ අපෙන්ඩිසියේ ප්‍රකාර තුන්වෙනිවූ ප්‍රමාණයේ ඉහළ කොටසේ දෙවෙනි පෙළෙන් සමර්ථවූ බවටද, පාඨශාලා පරීක්ෂක කෙනෙකුගෙන් සහතිකපත්‍රයක් ලබා සිටිනම් පාඨශාලාවට ඒ පිරිමි ළමයාගේ හෝ ගැණු ළමයාගේ පැමිණීම උවමනා නොකෙරේ.

6. පාඨශාලාවක් විවෘතකිරීමට කැමති කිසිවෙකු විසින් නොහොත් ඉංග්‍රීසි හෝ වෙන යම් භාෂාවක් ඉගැන්වීම ඉහතින් පවිච්චිනොකරණලද ගොඩනැගිල්ලක හෝ පාඨශාලා මණ්ඩපයක පාඨශාලාවලට යායුතු වයසැති ළමයින් පැමිණෙන පන්තියකට හෝ පන්තිවලට ඉහතකී යම් භාෂාවක් ඉගැන්වීමට කැමති කිසිවෙකු විසින් එබඳුවූ පාඨශාලා කම්හාන්ත හෝ ඉගැන්වීමට පටන්ගන්ට ඉතාම අඩුවශයෙන් මාසයකට කලින් ඒ බව ඉතාමත් කිට්ටුව සිටින අධ්‍යාපන පරීක්ෂක තැනට හෝ උප පරීක්ෂකතැනට දැන්විය යුතුයි. ඊට පසු ඔහු පවත්වන්ටයන පන්තිය නොහොත් පන්ති සම්බන්ධව සහ අධ්‍යාපන ක්‍රම සම්බන්ධව අධ්‍යාපනාධිපතිතුමාට උවමනාකරණ ඒ ඒ තොරතුරු දන්වා සිටිය යුතුයි.

7. මෙම අතුරු පණත් හෝ මේවායින් යම් කිසිවක් නොපවත්වන්නාවූ හෝ නොසලකන්නාවූ හෝ කඩකරන්නාවූ යම් මව්පියෙක් වැරදිකාරයා වූවිට එක එක වරදකට රුපියල් විස්සකට වැඩිනොවන දඩයකට හෝ දඩ නොගෙව්වොත් දහහතර දවසකට වැඩිනොවන කාලයකට හිරඅඩස්සියට සහ නොකඩව කරගනයන වරදකට දවසකට රුපියල් දහයකට වැඩිනොවන මනත්වැඩි දඩයකටද යටත්විය යුතුයි.

සැලකියයුත්තක්—මෙහි පහත දක්වන්නේ මේ අතුරුපණත්වල අංක 1ක සහ 4ර දරණ කාණ්ඩවල සටහන්කර තිබෙන ග්‍රාම පාඨශාලා ආඥාවේ කොටස්ය.

20 (1) (බී) වෙනි කාණ්ඩය—යම් මව්පියෙක් විසින් තමාගේ ළමයා ආණ්ඩුවෙන් ආධාර ලැබීම පිණිස අධ්‍යාපනාධිපති තුමා විසින් ලියා පදිංචිකරණලද පාඨශාලාවකට හෝ ආණ්ඩුවෙන් ආධාර ලැබීම පිණිස ලියාපදිංචිකරන්ට ඉල්ලන ලදුව එසේ කිරීම කල්පනාව සිට තිබෙන පාඨශාලාවකට හෝ ප්‍රමාණවූද යෝග්‍යවූද, ඉගැන්වීම කරණ තැනක්යයි අධ්‍යාපනාධි තුමා විසින් සහතික කරණලද පාඨශාලාවකට හෝ නොකඩව යන්නේය කියා නොහොත් ළමයාගේ ඉගණීම පිණිස අධ්‍යාපනාධිපති තුමා විසින් ප්‍රමාණයයි, යෝග්‍යයයි කියා සහතික කටයුතුසේ වෙන යම් පිළිවෙළක් යොදාගෙණ තිබේ යයි කියා ඔප්පුකළහොත් නොහොත් ළමයා බලාත්කාර ඉගැන්වීමෙන් නිදහස්කළ යුතුයයි අධ්‍යාපනාධිපති තුමාගේ සහතිකයක් පෙන්වා සිටියහොත් එකී තැනැත්තා විසින් තම ළමයාගේ ඉගැන්වීම පිණිස ප්‍රමාණවූද, යෝග්‍යවූද, පිළිවෙළක් යොදාගෙණ තිබේයයි සලකනු ලැබේ. එසේද වුවත් තමාගේ ළමයා එබඳු පාඨශාලාවකට නොයැවීමට සැලකිය යුතු හේතුවක් තිබේය කියා මව්පියා විසින් උසාවියට ඒත්තුගතහැකිසේ ඔප්පුකළහොත් තම ළමයා පාඨශාලාවට නොයැවීම ගැණ ඔහු වරදකාරයා කරණු නොලැබේ. අසනීප නිසා හෝ වෙන යම් මගඇරිය නොහැකි හේතුවක් නිසා ළමයා පාඨශාලාවට යවන්ට නොහැකිවිය කියා ඔප්පුකළහොත් පාඨශාලාවට ළමයා නොයවා සිටීමට ඔහුගේ මව්පියාට සැලකිය යුතු හේතුවක් තිබෙන බව සලකනු ලැබේ.

21වෙනි වගන්තිය—ආගම ධර්මය උගන්වන පාඨශාලාවක් දිස්ත්‍රික් පාඨශාලා සභාව විසින් මෙහි පහත පෙණෙන කරුණුවලින් සතුටුදායකය කියා පිළිගත්තොත් මිස එසේ නැත්නම් එය ප්‍රසිද්ධ ස්වභාෂා පාඨශාලාවක් මෙන් පිළිගනු නොලැබේ.

(*a*) පාඨශාලා කාලවක්‍රයෙහි නියමකරතිබෙන කාලය තුළදී ආගම ධර්මය ඉගැන්විය යුතුයි.

(*b*) පාඨශාලාවට අයිතිවූ ආගමේ ශිෂ්‍යයන්ට හැර අන්‍යාගම්වල ශිෂ්‍යයන්ට ඔවුන්ගේ මව්පියෝ විරුද්ධ වෙත්නම් ඔවුන්ට අයිතිනුවූ ආගම ධර්මය ඉගැන්විය යුතුනොවේ.

(*c*) ආගම ධර්මය ඉගෙණනොගන්නාවූ ශිෂ්‍යයන් ආගම ධර්මය ඉගැන්වීමට නියමකර තිබෙන කාලය තුළදී වෙන ඉගෙණීම්වල යෙදවිය යුතුයි.

(*d*) ආගම ධර්මය උගන්වන කාලය තුළදී එම කාමරයේම එබඳුවූ ශිෂ්‍යයන්ගේ ඉඳීම ගැණ ඔවුන්ගේ මව්පියෝ විරුද්ධ වෙත්නම් පාඨශාලා ශාලාවේ අන් කොටසක ඉඳ ඉගෙණීම කරන්ට ඔවුන්ට ඉඩදිය යුතුයි. නැතහොත් එම කාලය තුළදී පාඨශාලාවෙන් මගඇර සිටීමට ඔවුන්ට ඉඩදිය යුතුයි.

(*e*) මෙම වගන්තියේ පිටපතක් ඉංග්‍රීසි, සිංහල දෙමළ යන භාෂාවලින් ලියා පාඨශාලාවේ කාටත් පෙණිය හැකි තැනක එල්ලා තැබිය යුතුයි.

(අත්සන්කළේ) ජී. ඇස්. වුඩ්මන්,
සභාවේ ප්‍රධානතැන වශ.

'ඒ' අක්ෂරය දරණ අඩෝලිපිය.

ඉහතකී අතුරුපණත්වල දක්වා තිබෙන භූමිභාගයේ විස්තර:—තිරිකුණාමලේ ආදායම් පලාත.

'බී' අක්ෂරය දරණ අඩෝලිපිය. කොට්ටියාර් පත්තුව.

| | |
|---|---|
| ආනෙයිතිවු රෝමානු කතෝලික | පාඨශාලාව |
| ඊච්චිලම්පත්තෙයි රෝමානු කතෝලික | එම |
| කංකුවේලි වැස්ලියන් | එම |
| කිලිවෙට්ටි ආණ්ඩුවේ ස්වභාෂා | එම |
| කූනිතිවු වැස්ලියන් | එම |
| මල්ලිගෙයිතිවු වැස්ලියන් | එම |
| මරුතඩිච්චේනෙයි වැස්ලියන් | එම |
| මෙන්කාමම් වැස්ලියන් | එම |
| මූදූර් රෝමානු කතෝලික | එම |
| මූදූර් වැස්ලියන් | එම |
| පච්චනූර් රෝමානු කතෝලික | එම |
| පට්ටිතිඩල් රෝමානු කතෝලික | එම |
| පල්ලිකුඩියිරුප්පු වැස්ලියන් | එම |
| සම්පූර් වැස්ලියන් | එම |
| තොප්පූර් ආණ්ඩුවේ ස්වභාෂා | එම |
| **තම්බලගම් පත්තුව.** | |
| ආලන්කේනි රෝමානු කතෝලික | පාඨශාලාව |
| පෙරියකිණ්ණියෙයි ආණ්ඩුවේ ස්වභාෂා | පාඨශාලාව |
| සින්නකිණ්ණියෙයි වැස්ලියන් | එම |
| තම්බලගම වැස්ලියන් | එම |
| උප්පාර් රෝමානු කතෝලික | එම |
| **කට්ටුක්කුලම් පත්තු නැගෙනහිර.** | |
| කුම්බුරුපිටිය වැස්ලියන් | පාඨශාලාව |
| කුච්චවේලි වැස්ලියන් | එම |
| නිලාවේලි වැස්ලියන් | එම |
| පුල්මෝඩෙයි ආණ්ඩුවේ ස්වභාෂා | එම |
| තෙන්නමරවාඩි රෝමානු කතෝලික | එම |
| තිරියායි වැස්ලියන් | එම |
| **කට්ටුකුලම් පත්තු බස්නාහිර.** | |
| ගෝමරන්කඩවල ආණ්ඩුවේ ස්වභාෂා | පාඨශාලාව |
| මොරවැව ආණ්ඩුවේ ස්වභාෂා | එම |
| **ලෝකල්බෝඩ් සීමාවලින් පිට නගරය.** | |
| සල්ලි වැස්ලියන් | පාඨශාලාව |
| සාම්බල්තිවු වැස්ලියන් | පාඨශාලාව |

## උපාධ්‍ය නීති.

### වර්ෂ 1892කේ කුඩා නගරවල සනීපආරක්ෂාව සම්බන්ධ ආඥාපනත.

1909යේ 30වෙනි ආඥාපනතෙන් අමුතුකරනලද වර්ෂ 1892කේ 18වෙනි ආඥාපනතේ 9 E (2) (d) යන කාණ්ඩය යටතේ නැගෙනහිර පළාතේ මඩකලපුවේ සනීප ආරක්ෂක සභාව විසින් සාදනලද මෙහි පහත දක්වන අතුරුපනත් වැඩබලන ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ සම්මතය ඇතුව පිළිගත්තාලද්දුව මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධකරනලදී.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
ජ්. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රටාරිස් වශ.

වර්ෂ 1918ක්වූ ජූනි මස 13වෙනි දින කොළඹ
මහසෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එකී අඩෝලිපිය.

1. කිසිම කෙනෙකු විසින් වතුර හෝ වෙනයම් දෙයක් සමග මිශ්‍රකර තිබෙන කිරි සම්පාදනකිරීමවත්, විකිණීමවත්, විකුණන්ට ගෙණයාමවත්, විකිණීමට එළියේ තිබාගෙණ සිටීමවත් නොකළ යුතුයි.

2. කිරියෝදය අහක්කර තිබේය කියා කිරි මිලයටගන්නාවූ හෝ කිරි මිලයටගන්ටකියා දෙනුලබන්නාවූ තැනැත්තාට පළමුකොට නොදන්වා කිසිවෙකු විසින් යෝදය අහක්කර තිබෙන කිරි විකිණීම හෝ මිලයටගන්ට කියා දීම යුතුනොවේ.

3. සභාපතිතුමාටද, ආණ්ඩුවේ දොස්තර මහත්මයාට හෝ ඒ මහතාගේ දෙවෙනියාටද, පොලිසියේ ඉන්ස්පැක්ටර් තැනටද "සැනිටරි බෝඩ්" නම් සභාවේ ඉන්ස්පැක්ටර්තැනට හෝ විශේෂ වශයෙන් සභාපතිතුමා විසින් ලියවිල්ලක්පිට බලය දුන් කිසිවෙකුටද කිරි විකුණන්නාවූ හෝ විකිණීමට අරගෙණ ඇවිදින්නාවූ හෝ විකිණීමට එළියේ තබාසිටින්නාවූ කිසිවෙකුගෙන්ද, ලියාපදිංචිකරණලද කිරිපට්ටිවලින්ද පරීක්ෂාකර බැලීම පිණිස සැම්පල්වලට කිරි කිසියම්විටකදී ඉල්ලා බාරගත හැකිය. එසේ කිරි විකුණන්නාවූ හෝ විකිණීමට අරගෙණ ඇවිදින්නාවූ හෝ විකිණීමට එළියේ තිබාගෙණ සිටින්නාවූ සියලුදෙනා විසින්ද, සෑම කිරිපට්ටිකාරයන් විසින්ද ඉහතකී මුලාදෑනින්ට එකී කාරණය පිණිස සැම්පලට කිරි ගැනීමට ඉඩදිය යුතුයි.

### වර්ෂ 1889යේ නොම්මර 24 දරණ ගම්සභා ආඥාපණත.

වර්ෂ 1889යේ නොම්මර 24 දරණ ආඥාපණතේ 5වෙනි වගන්තියේ ප්‍රකාර කුඩා කොඩාසවල් වන වයඹ දිසාවේ දෙමළ හත්පත්තුවේ ප්‍රධාන මුලාදෑනියාට අයිති හත්පත්තුවේ කුඩා කොඩාසවල් වන පෙරවිලිපත්තුව, රාජවන්නිපත්තුව, කරම්බෑපත්තුව, පාණ්ඩිතාපත්තුව, කුමාරපල්ලම්පත්තුව, කිරිමැටියාපත්තුව යන පත්තුවල වැසියන් විසින් වර්ෂ 1905යේ ජූලිමස 7වෙනි දින සහ නො. 6,062 දරණ ගැසට්පත්‍රයෙහි 1905යේ ජූනි 15වෙනි දින දරණ දැන්වීමෙන් ප්‍රසිද්ධකරනලද නියෝගවලට වැඩිමනත්ව වර්ෂ 1889යේ නොම්මර 24 දරණ ආඥාපණතේ 6වෙනි වගන්තියේ (4) වෙනි කාණ්ඩය යටතේ පණවන ලද මින්පහත සඳහන් නියෝග ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ කැමැත්ත ඇතුව ස්ථිරකර මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් එළිදරව්කරනු ලැබේ.

ජ්. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රටාරිස් වශ.

වර්ෂ 1918ක්වූ ජූනි මස 12වෙනි දින කොළඹ
මහසෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

කියනලද නියෝග.

20 (*a*) ඔටුන්නට හිමි ඉඩමක් ආණ්ඩුව විසින් ගමක වැසියන්ගේ ප්‍රයෝජනය පිණිස පේන් ඉඩමක් හැටියට වෙන්කොට තැබූකල්හි, එම වැසියන් එකී ඉඩමේ සහ එකී ඉඩම කුඩා කොඩාසවලට බෙදන්ට යෙදුනොත් එම කොඩාසවලත් මායිම් සෑම කල්හිම රජේම්මහත්මයාගේ අණවල් පරිද්දෙන් පවතින මායිම් ගල්වලින් ඇරලා සහ වෙන් වෙන්වශයෙන් පේන්ට තබන්ටත් යුතුය.

(b) ඉහළින්කී ප්‍රකාර ආණ්ඩුව විසින් හේන් ඉඩමක් වෙන්කොට තැබූකල්හි එකී ඉඩම මෙම නියෝගවල සඳහන් ප්‍රකාර කැබලි 12කට බෙදීම රජේ මහත්මයාගේ යුතුකමකි. මෙකී කැබලි අවුරුදුපතා එකිනෙකට වපුරන්ට ඕනෑය. අවුරුද්දක් ඇතුළත වපුරන්ට නියමකරනලද කැබැල්ල මිස අන්කිසි කැබැල්ලක වැපිරීම නීතියට විරුඬය. රජේ මහත්මයා එකිනෙක කැබැල්ලට පිළිවෙළට නොම්මර තබා ප්ලෑනක් සාදා, උවමනාවිටක බලන පිණිස උන්නැහෙගේ කන්තෝරුවේ තබන්ට ඕනෑය. මෙම ප්ලෑනෙන් පිටපතක් ගම් ආරච්චිලට සපයන්ටත් ඕනෑය.

(c) හේන් වැපිරීමේ කාලය පටන්ගන්ට පෙර සෑහෙන කාලයක් ඇතුළතදී ගම්ආරච්චිල විසින් ගම් වැසියන් අඬංගු සභාරැස්වීමක් පවත්වන්ට ඕනෑය. අවුරුද්ද ඇතුළත වපුරන්ට නියමකරනලද කැබැල්ලේ කොයි කොයි කොටස වැපිරීම පිණිස එක එක පවුලේ ප්‍රධානියාට වෙන්කළාද කියා එකී සභාරැස්වීමේදී නියමකරගන්ට ඕනෑය. එසේ වෙන්කරනලද කෑල්ල පවුලේ ප්‍රධානියා විසින් ආරක්ෂාකරණලද වැඩිමහල්ලන්ගේ සහ බාලයින්ගෙත් ගණනේ හැටියට නිසි ප්‍රමාණයට තිබෙන්ට ඕනෑය. එසේ වෙන්කරදුන් කෑල්ල මිස වෙනයම් කෑල්ලක් එළිකරන්ට පවුලේ ප්‍රධානියාට යුතුකමක් නැත. මතුකී ප්‍රකාර අවුරුද්ද ඇතුළත හේන් වපුරන්ට නියම කරගත් ඉඩන් කැබැල්ල වෙන්කර ගත්තාම, ගම්ආරච්චිල සභාරැස්වීමේ ප්‍රවෘත්තිය ගම්සභා කොමිටියට යවන්ට ඕනෑය. ඊට සමගම අවුරුද්ද ඇතුළත වැඩකරන්ට නියමකරගත් ඉඩම් කැබැල්ල වැපිරීම පිණිස පොදු බලයක් ඉල්ලා ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ඉල්ලුම් පත්‍රයක් යවන්ටත් ඕනෑය. එළිකිරීම පටන්ගන්ට අඩුගනනෙත් මාසෙකට පෙර ගම්සභා කොමිටිය එවැනි ඉල්ලුම්පත්‍රය ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට යවන්ට ඕනෑය. යම් විරුඬතාවයකට නිසි කාරණ නොමැතිනම් ගම්මු වෙනුවට එම බලපත්‍රය ගම් ආරච්චිලගේ නමට දෙනු ලැබේ.

එවැනි බලපත්‍ර දුන්කල ඒ සම්බන්ධව අනතෙර ගසා ප්‍රසිඬකරන්ට ඕනෑය. මතුකී ප්‍රකාර පොදු බලපත්‍රය උපඒජන්ත උන්නාන්සේ විසින් දෙනතුරු, කිසියම් කෙනෙක් විසින් එසේ හේන් වැපිරීමට වෙන්කර තබනලද ඉඩමෙන් කිසිම කෑල්ලක් එළිකෙරීම අයුතුය.

(d) අවඩා ගම්වැසියකුට මිස වෙන පිට කෙනෙකුට වැපිරීම තහනම්ය.

(e) යම් ආරවුලක් සිදුවිනම් ගම්සභා කොමිටියේ ප්‍රධානතැනගේ තීන්දුව අන්තිමෙටම බාරගන්ට ඕනෑය.

කියනලද බලපත්‍රය.

දෙමළහත්පත්තුවේ ගම්සභා කොමිටිය විසින් හේන් වැපිරීම පිණිස වෙන්කර තබනලද ඉඩම් සම්බන්ධව පණවා තිබෙන නියොගවල් ප්‍රකාර වර්ෂ 19——ගේ——ව——නොම්මර——දරන මුල් සිතියමේ නොම්මර——දරන හේන් ඉඩන් කට්ටියෙන් නොම්මර——දරන ඉඩම් කැබැල්ල වපුරාගැනීමට——ගේ ගම්වැසියන් වෙනුවට බලය පුත්තලම් දිස්ත්‍රික්කුවේ දෙමළහත්පත්තුවේ——කෝරළේ——පලාතේ ගම්ආරච්චිලට දෙන්ට යෙදුනා ඇත.

---

වර්ෂ 1898වේ නාගරිහිවෘඞික සභා ආඥාපණතයි.

වර්ෂ 1900ක්වූ මාර්තු මස 2වෙනි දින දතම දරණ නොම්මර 5,679 දරණ ආණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිඬකරනලද බදුළු නාගරිහිවෘඞික සභාව විසින් සාදනලද වර්ෂ 1900ක්වූ පෙබරවාරි මස 28වෙනි දින දතම දරන 1898වේ 13වෙනි ආඥාපණතේ 57 වෙනි කාණ්ඩයේ ප්‍රකාර පාංගෙවල් සම්බන්ධ උපාංගනීති, එකී නාගරිහිවෘඞික සභාව විසින් අවලංගුකිරීමද ඒ වෙනුවට සාදනලද පාන්ගෙවල් සම්බන්ධ මෙහිපහත පෙනෙන උපාංගනීතිද, ව්‍යවස්ථාදායක මන්ත්‍රණසභාගත ආණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ස්ථිරකරනලදබව මෙයින් ප්‍රසිඬකරන්ට යෙදුනාඇත.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,
ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වමහ.

වර්ෂ 1918ක්වූ ජූනි මස 13වෙනි දින කොළඹ
මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

පාන්ගෙවල් සම්බන්ධවූ උපාංගනීති.

1. "පාන්ගෙය" යන්නෙන් මනුෂ්‍යයාගේ ආහාර පිණිස විකිණීමට පාන්, බිස්කෝත්තු හෝ පැනිරස කැවිලිවගී සාදන ඕනෑම ස්ථානයක් හගවයි. තවද එබඳු ආහාර සෑදීමට සූදනම්කරනු ලබන හෝ එබඳු ආහාර සූදනම්කිරීමට උවමනා ද්‍රව්‍ය රැස්කර තබන්නාවූ හෝ කවර ස්ථානයක් වුවත් ඊට අන්තර්ගතවේ.

2. සභාපතිතැනගෙන් අවුරුදුපතා ගන්නාලද බලපත්‍රයක් නොමැතිව කිසිවෙකුටත් පාන්ගෙයක් තබන්නට බැරිය. එම බලපත්‍රය එහි අන්තිම දිනය වන දෙසැම්බර් මස 31වෙනි දින දක්වා හෝ එම බලපත්‍රය අවලංගුකරනු ලබනතුරු පාවිච්චිකළ හැකිය. මේ අණපනත්වලට අනුව ක්‍රියාකිරීම අනපසුකරණ කාටවුවත් එම බලපත්‍රය දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැන කෙරෙහි බලය පවරනලදී. එබඳු බලපත්‍රය මන්ත්‍රණ සභාගත ආණ්ඩුකාරතැනගේ කැමැත්ත ඇතිව ලෝකල් බෝඩ්) නාගරික සභාව විසින් අරමුනුකරනුලබන ශාස්තු ගෙවීමට වැඩිදුරටත් බැඳීතිබේ.

3. යම් කෙනෙක් යම් විනිශ්චය ශාලාවකදී දෙවනාවක් හෝ ඊට වැඩි වාරගණනාවක් මේ අණපනත් කඩකිරීම ගැන බුවම් කරනුලබන්නේ නම් එබඳු දෙවෙනි නඩුව ලියාතබන විශ්චයශාලාව මගින් මේ පරිච්ඡෙදය යටතේ "ලෝකල් බෝඩ්" භාපතිතැන විසින් ඒ අයට නිකුත්කරණලද එවැනි බලපත්‍රය අවලංගුකිරීම ව්‍යවස්ථානුකූලවේ. විනිශ්චය ශාලාවකදී බල ත්‍රයක් එසේ අවලංගුකළවිට එම අයට යම්කිසි අලුත් බලපත්‍රයක් නිකුත්කිරීම සභාපතිතැනගේ කැමැත්තේ ප්‍රකාර ප්‍රතික්ෂෙප කිරීමට (ලෝකල් බෝඩ්) නගර සභාවේ සභාපතිතැනට මෙයින් බලය දෙනලදී.

4. පාන්පිටි අනන ගෙයක ඉතා අඩු ගණනෙන් දිග අඩි 15කින් හා පළල අඩි 12කින් සම්පූර්ණ වියයුතුය. ගෙය පුරා තය වැදගන්නා පිණිස අඩු ගණනෙන් දෙපාර්ශවයකින්වත් පළලින් අඩි හතකට අඩුනොවන අවකාශ ස්ථාන පිටතින් ඇති ය යුතුයි. පෝරනුවේ දෙර පිපි අණන ගෙය කෙළින් නොදැමිය යුතුයි. පිටි අණන සියලු ගෙවලම (සීලිං) වියන්තට්ටුවක් ගින් තැබිය යුතුයි.

5. සියලුම පාංගෙවලම වාතාශ්‍රය හා ආලෝකය යහපත් අන්දමට ඇතිවිය යුතුය. සියලු කොටසෙහි භිත්ති උස අඩි තකට අඩුනොකොට ගඩොලින් හෝ ගලින් හෝ කබුක්ගලින් බැන්ද යුතුය. එහි ඇතුළ හුණු පදලම්න් නිමවා හමාසයකට රක් සුදුහුණු ගෑයුතුය. බොහෝකල් පවතින ද්‍රව්‍යයකින් පියසි සෑදිය යුතුය. අවුරුදු හතරකට වරක් වියන්තට්ටු අලුත් ඩියාකර සුදුහුණු ගෑයුතුයි. නැතහොත් ලෑලි සෙත්තුකොට වද්ද සායම් හෝ තීන්ත හෝ ගෑයුතුයි. ගෙබිම හැම තැනම මෙන්ති පදලම දමා සෑහෙන පමණ කාණු සෑදිය යුතුය. සියලු ගබඩාවලම දොර බිගලි විවරකළහැකිවූ ගෙබිමේ ප්‍රමාණ යන් $\frac{1}{16}$ පංගුවකට අඩුනොවන සම්පූර්ණ විශාලත්වයක් ඇතිවූ ජනෙල තැබිය යුතුය.

6. පාන් සහ කැවිලි සෑදීමට ගන්නා හැම භාජනම ඉතා පිරිසිදු අන්දමට තැබිය යුතුයි. තවද ඒවා ගෙයි බිම ශුඬ රනවිට ඉවත්කළහැකි වියයුතුයි.

7. අඩු ගණනෙන් විසිහතර පැයකට වරක් බැගින්වත් ගෙයි බිම පරීක්ෂා ඇතිව සූරා ඇමැන්ද යුතුය. තවද ඒ කැලි සළ දියකාන්දු නොවන භාජනයකට එවිගසම දමා දිනපතා පාන් ගෙයින් පිටකළ යුතුය.

8. පාන්ගෙවල් සියල්ලම පිරිසිදුලෙස තැබිය යුතුය. තවද කාණුවලින් හෝ වැසිකිළිවලින් හෝ වෙනත් කුණු කස ත් නැගෙණ අශුඬ වාතයෙන් තොරවිය යුතුය.

9. කිසිම පාන්ගෙයක් වැසිකිළියකින් හෝ පෝරගොඩකින් නොවසනලද කුණු වළකින් අඩි පනහක් ඇතුළත තැබිය යුතුයි.

10. පාන් සෑදීමට වුවමනාවූ ද්‍රව්‍ය හැර වෙන කිසිම බඩුවක් හෝ ද්‍රව්‍යයක් පාන්ගෙය තුළ නොතැබිය යුතුයි.

11. මේසවල මුදුන් හොඳකාර මෝරාපු සෙත්තු වද්දනලද ලෑලිවලින් හෝ අහතරය නැති දිය කාන්දු නොවන වෙන යම් ද්‍රව්‍යයකින් හෝ සෑදිය යුතුයි. තවද ඒවා දවස්පතා සුරා ශුද්ධකළ යුතුයි.

12. කවර කරුණක් නිසාවත් කිසිම සතෙක් පාන් ගෙයක තබාගත යුතුනොවේ.

13. බෝවෙන ලෙඩකින් පෙළෙන්නාවූ හෝ පාන්ගෙයි භාරකාරයාගේ දැනීම ඇතිව බෝවෙන ලෙඩකින් ලඟදී පෙළෙමින් සිටියාවූ හෝ එවැනි ලෙඩකින් පෙලෙන අයෙකුට සාත්තුකිරීමෙහි ලඟදී යෙදී සිටියාවූ හෝ කෙනෙකුට පාන් ගෙයට ඇතුල්වීමට හෝ පාන් සෑදීමට හෝ අවට විකිණීමට හෝ පාන් ගෙය භාරකාරයා විසින් ඉඩනොදිය යුතුයි.

14. පාන් සෑදීමේ හෝ පිලිස්සීමේ යෙදීසිටින සියලුදෙනාම පාන් සෑදීමට පටන්ගන්නට පළමුකොට දෙඅත් සෝදා පපුව සහ ශරීරය වැසෙනසේ පිරිසිදු සුදු වැස්මක් හෙවත් සැට්ටයක් හැඳ සුදු කලප්පාවක් හෝ තොප්පියක් හෝ හිස දමාගත යුතුය.

15. පාන් විස්කෝත්තු හා මිහිරි රසකැවිලි සෑදීමෙහි යෙදීසිටින්නන්ගේ ප්‍රයෝජනය පිණිස හොඳ වතුර සහ සබන් සපයා තැබිය යුතුයි.

16. විකිණීමට තබන සියලුම පාන් විස්කෝත්තු හා රසකැවිලිවලහි මැස්සන්ට ඇතුල්විය නොහැකිලෙස තනනලද වීදුරු පෙට්ටිවල තැබිය යුතුයි. පෙට්ටි ඉතාමත් පිරිසිදු අන්දමට තැබිය යුතුයි.

17. පාන් සෑදීමට වුවමනා පිටි, වතුර ආදීවූ සියලුම ද්‍රව්‍ය යහපත් ඒවා වියයුතුයි. තවද බිමින් අඩි තුනකට අඩු නොකොට සාදනලද උස් ඉඩමක පිටි තැබිය යුතුයි.

18. පාන් පුලුස්සන ගෙවලට අයිති බිදුල්වල කැලිකසල සියල්ලම දවස්පතා ඉවත්කළ යුතුයි. කාණු සියල්ලත්ම හොඳකාර සේදිය යුතුයි.

19. පාන්ගෙයි මට්ටමට ඇත්තාවූද එම ගොඩනැගිල්ලේ කොටසක්වූද, කිසිම ස්ථානයක බිම පටන් වියන්තට්ටුව දක්වා පැතිර තිබෙන ක්‍රමයකින් පාන්ගෙයින් නිසි විධියට වෙන්කර නැත්නම් එය නිදාගැනීමට නොගත යුතුයි. මුත්‍ර කොට්ටුවක් හෝ වැසිකිලියක් හෝ අළුවළක් හෝ පාන්ගෙයතුළ හෝ ඊට සම්බන්ධකොට හෝ නොතැබිය යුතුයි.

20. සියලු සුදුසු වේලාවලවද පාන් පිලිස්සීම කරන්නාවූ ඕනෑමවිටකටද පාන්ගෙට හෝ පාන් විකිණීමට තබා තිබෙන්නාවූ ස්ථානය ප්‍රවේශව "ලෝකල් බෝඩ්" සභාවේ පරීක්ෂකතැන විසින් හෝ ප්‍රධානතැන විසින් ලියමනකින් බලය දෙනලද වෙන කෙනෙකු විසින් හෝ පරීක්ෂාකරන්නට නීතියේ ආකාර බලය තිබේ.

21. මේ අණපනත්වල පිටපතක් රාමුවක දමා සියලු පාන්ගෙවල්වලම පෙනෙන තැනක එල්ලා තැබිය යුතුයි

## ඉඩම් විකිණීම.

**No. 2,529, C. P.**—මධ්‍යම දිසාවේ මාතලේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 8වෙනි දිනවූ බෘහස්පතින්දා දවල් 1ට මාතලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ උතුරු පලාතේ වගපනහළුඩසියපත්තුවේ පෙතලබොඩ පිහිටාතිබෙන බිම්කැබලි 10ක්.

සිතියම 6,700. ගම—පෙතලබොඩ. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | අරන්ගලමූකලාන | — | කැලෑව (ඉතිරිකර තිබෙන අරන්ගලමූකලානට යාකිරීමට) විකුණනු නොලැබේ | 3 3 15 | — |
| 2 | එම | ජේ. ජේ. ජැමිසන් මහතා | එම | 30 1 0 | — |
| 3 | එම | එම | එම | 0 1 12 | — |
| 4 | අරන්ගලවත්ත | — | අවුරුදු 7සත් සිට 9 දක්වා වයස ඇති රබර් තිබේ (ජැමිසන් මහතා විසින් අල්ලාගන තිබේ) | 0 2 28 | 200* |
| 5 | අරන්ගලමූකලාන | ජේ. ජේ. ජැමිසන් මහතා | කැලෑව (ඉතිරිකර තිබෙන අරන්ගලමූකලානට යාකිරීමට) විකුණනු නොලැබේ | 0 1 37 | — |
| 6 | අරන්ගලවත්ත | — | අවුරුදු 7සත් සිට 9 දක්වා වයස ඇති රබර් තිබේ (ජැමිසන් මහතා විසින් අල්ලාගන තිබේ) | 1 0 16 | 200* |
| 7 | අරන්ගලමූකලාන | ජේ. ජේ. ජැමිසන් මහතා | කැලෑව (ඉතිරිකර තිබෙන අරන්ගලමූකලානට යාකිරීමට) විකුණනු නොලැබේ) | 0 2 35 | — |
| 8 | අරන්ගලවත්ත | — | අවුරුදු 7සත් සිට 9 දක්වා වයස ඇති රබර් සහ ක්‍රොටන් තිබේ (ජැමිසන් මහතා විසින් අල්ලාගන තිබේ) | 0 3 33 | 225* |
| 9 | අරන්ගලමූකලාන | ජේ. ජේ. ජැමිසන් මහතා | කැලෑව (ඉතිරිකර තිබෙන අරන්ගලමූකලානට යාකිරීමට) විකුණනු නොලැබේ | 1 1 13 | — |
| 10 | අරන්ගලවත්ත | — | අවුරුදු 7සත් සිට 9 දක්වා වයස ඇති රබර් සහ ක්‍රොටන් තිබේ (ජැමිසන් මහතා විසින් අල්ලාගන තිබේ) | 0 1 0 | 200* |

* බේරුම්කරන පිණිස.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ප්ලෑන් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1918ක්වූ ජූනි මස 17වෙනි දින කොළඹ
මහසෙක්‍රටාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහසෙක්‍රටාරිස් වෙනුව.

---

**No. 2,530, C. P.**—මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩමේ බද්ද ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1918ක්වූ අගෝස්තු මස 5වෙනි සඳුදින පස්වරු 2ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නාගරිකසභා මණ්ඩලයතුළ මැලබාර්වීදියේ පහල පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

බදු සිතියම 217. නගරය—මහනුවර. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අවුරුද්දකට තක්සේරු බදු මිල, රු. |
|---|---|---|---|---|---|
| — | — | ජෝන්සිංඤෝ | ඉඩුඉඩම | 0 0 36 | 5 |

### බද්දේ කොන්දේසි.

මාසයක් කල් ඇතිව නොතිසි දුන්විට තීන්දුවෙනලෙස "ටිකට්ඔෆ්ඔකියුපැන්සි" නම් අවසරපත්‍රයක් පිට ඉඩම බදු දෙනු ලැබේ

එලවලු වැවීම පිණිස ඉඩම පාවිච්චිකළ යුතුයි.

කල් පවතින ගොඩනැගිලි ඉඩමේ සාදන්ට බැරිය.

බද්ද ගැණ වැඩිදුර කාරණ මහනුවර ඒජන්ත උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුලුවන. ප්ලෑන මහනුවර කච්චේරියේදී බලාගන්ට පුළුවන.

වම් 1918ක්වූ ජූනි මස 19වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම් වම්හ.

---

**No. 2,041, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1918ක්වූ අගෝස්තු මස 7වෙනි දිනවූ බදාදා පස්වරූ 1ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම්, හුරුලු සහ කලාගම්පලාත්වල පිහිටාතිබෙන බිම්කැබලි 21ක්.

සිතියම 4,362. ගම—මාටමුවාකෝරලේ රඹෑව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1902 | දඹගහඅක්කරේ | කපුරුහාමි මොහොට්ටාල සහ තවත් අය | වියට සුදුසු කැලේ | 2 2 14 | 20*a* |
| | සිතියම 4,412. ගම—මාමිනියාකෝරලේ කපුබොඩගම. | | | | |
| 2035 | මීගහකැලේ | ඇස්. කපුරුහාමි සහ කේ. ඒ. මුදලිහාමි | වියට සුදුසු ලඳුකැලේ | 1 1 8 | 15*b* |
| 2036 | එම | එම | එම | 0 3 19 | 15*b* |
| 2039 | දඹගහකැලේ | එම | එම | 0 2 27 | 15*b* |
| 2040 | එම | එම | එම | 1 0 14 | 15*b* |
| | සිතියම 4,604. ගම—කල්පේකෝරලේ පෙතියන්නේකඩ. | | | | |
| 1 | දඹගහඉඩම | ඩබ්ලිව්. වන්නකුරල | වියට සුදුසු කැලේ | 3 2 24 | 17.50*c* |
| | සිතියම 4,897. ගම—උඩියන්කුලමකෝරලේ මහකැලෑගම. | | | | |
| 4 | එම | — | කුඹුක්වැවේ කේ. ඇල්. කපුරල වෙල්විදානේ විසින් අල්ලාගත් කුඹුර | 1 2 5 | 25*d* |
| | සිතියම 4,969. ගම—කල්පේකෝරලේ කිරිගොල්ලෑව. | | | | |
| 1 | එම | කිරිගොල්ලෑවේ ඒ. කපුරල | වියටසුදුසු අත්දඹුවාකැලේ | 1 0 3 | 21*e* |
| | සිතියම 5,074. ගම—මාටමුවාකෝරලේ මඩවල. | | | | |
| 1 | දඹගහලන්ද | මඩවල වී. කුඩාපුස්පා සහ තවත් 11ක් | වියට සුදුසු කැලේ | 2 0 34 | 15*f* |
| 2 | එම සහ දඹගහඉඩම | එම | එම | 0 3 26 | 15*f* |
| | සිතියම 5,075. ගම—උලගල්ලකෝරලේ පඩිකෙටුවැව. | | | | |
| 3 | මයිලගහඉඩම | පඩිකෙටුවැවේ ඇස්. වී. කපුවා | වත්තට සුදුසු පිට්ටනිබිම | 0 3 24 | 15*g* |
| | සිතියම 5,143. ගම—මාටමුවාකෝරලේ ගල්කඩවල. | | | | |
| 1 | හැලඹගහඉඩම | ගල්කඩවල වන්නකුරල ලේකම සහ තවත් 10 දෙනෙක් | කැලේ | 5 0 34 | 20*h* |
| | සිතියම 5,144. ගම—කිරලවකෝරලේ කිරිදිවත්ත. අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ කේ. ඒ. බන්ඩා. | | | | |
| 1 | ගොඩවත්තේහේන හෝ මීගහවත්ත | බන්ඩා උපාසකරල | වත්ත | 1 0 13 | 35*i* |
| 2 | එම | එම | බන්ඩා උපාසකරල විසින් අල්ලාගත් බිම | 0 2 12 | 20*i* |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 4 | මයිලගහහේන | කිරිදිවත්තේ කේ. උක්කුබන්ඩා | වියට සුදුසු පිට්ටනි බිම | 0 2 18 | 15*i* |
| | සිතියම 5,163. ගම—හෑගම්පහකෝරලේ මදවච්චිය. | | | | |
| 1 | දිවුල්ගහහේන | පී. ඒ. කපුරුබන්ඩා | වියට සුදුසු ලඳුකැලේ | 1 0 10 | 15*h* |

*a* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1914ක්වූ සැප්තැම්බර් මස 4වෙනි දින නොම්මර 6,657 දරණ ගැසට් පත්‍රය සහ වම් 1915ක්වූ මාර්තු මස 5වෙනි දින නොම්මර 6,701 දරණ ගැසට් පත්‍රය බලනු.

*b* මේවා මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1914ක්වූ ඔක්තෝබර් මස 2වෙනි දින නොම්මර 6,668 දරණ ගැසට් පත්‍රය බලනු.

*c* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1915ක්වූ අගෝස්තු මස 13වෙනි දින නොම්මර 6,733 දරණ ගැසට් පත්‍රය සහ වම් 1915ක්වූ ඔක්තෝබර් මස 22වෙනි දින නොම්මර 6,749 දරණ ගැසට් පත්‍රය සහ වම් 1916ක්වූ ජනවාරි මස 7වෙනි දින නොම්මර 6,768 දරණ ගැසට් පත්‍රය බලනු.

*d* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1917ක්වූ ජූනි මස 22වෙනි දින නොම්මර 6,883 දරණ ගැසට් පත්‍රය සහ වම් 1917ක්වූ නොවැම්බර් මස 16වෙනි දින නොම්මර 6,909 දරණ ගැසට් පත්‍රය සහ වම් 1918ක්වූ මාර්තු මස 22වෙනි දින නොම්මර 6 930 දරණ ගැසට් පත්‍රය බලනු.

*e* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1917ක්වූ අගෝස්තු මස 31වෙනි දින නොම්මර 6,895 දරණ ගැසට් පත්‍රය සහ වම් 1918ක්වූ පෙබරවාරි මස 15වෙනි දින නොම්මර 6,925 දරණ ගැසට් පත්‍රය බලනු.

*f* මේවා මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1917ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින නොම්මර 6,899 දරණ ගැසට් පත්‍රය සහ වම් 1918ක්වූ පෙබරවාරි මස 15වෙනි දින නොම්මර 6,925 දරණ ගැසට් පත්‍රය බලනු.

*g* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1917ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින නොම්මර 6,902 දරණ ගැසට් පත්‍රය සහ වම් 1918ක්වූ මාර්තු මස 22වෙනි දින නොම්මර 6,930 දරණ ගැසට් පත්‍රය බලනු.

*h* මෙය මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1918ක්වූ අප්‍රේල් මස 5වෙනි දින නොම්මර 6,933 දරණ ගැසට් පත්‍රය බලනු.

*i* මේවා මීට පෙර ප්‍රසිඬකරණලදී.—වම් 1917ක්වූ නොවැම්බර් මස 6වෙනි දින නොම්මර 6,909 දරණ ගැසට් පත්‍රය බලනු.

| නො | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන. අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | සිතියම 5,172. ගම—මාවබුවාකෝරලේ ගලපිටගල. | | | | | |
| 1 | දඹගහලන්ද .. | ගලපිටඅලේ ඇල්. ඒ. ලොරන්ස්අප්පු .. | වත්තට සුදුසු කැලේ .. | 0 | 2 | 3 | 25*j* |
| | | සිතියම 5,173. ගම—උලගල්ලකෝරලේ පසිරිමඩුව. | | | | | |
| 3 | දඹගහඅක්කරේ .. | — .. | .. පී. පිකිරාල සහ තවත් එක් කෙනෙක් විසින් අල්ලාගත් කුඹුර .. | 0 | 1 | 25 | 25*j* |
| | | සිතියම 273. ගම—නුවරගම්කෝරලේ කුඩාරත්මලේ. | | | | | |
| 11 | කුඩාරත්මලේතිස්බඹේ . | බී. වන්නියා සහ තවත් තුන්දෙනෙක් .. | ගම්බද එලිකිරීමක් .. | 0 | 0 | 34 | 20*k** |
| 11*c* | එම .. | එම .. | .. එම ... | 0 | 0 | 30 | 20*k** |
| | | සිතියම 281. ගම—නුවරගම්කෝරලේ ඉදිගස්පොතාන. | | | | | |
| 1*m* | ඉදිගස්පොතානකැලේ. | ඉදිගස්පොතානේ ඇස්. ඇන්. ජම්බා .. | කැලේ .. | 1 | 2 | 32 | 17.50*l* |

*j* මේවා මීට පෙර ප්‍රසිඛකරණලදී —වර්‍ෂ 1918ක්වූ මාර්තු මස 28වෙනි දින නොම්මර 6,932 දරණ ගැසට් පත්‍රය බලනු.

*k* මෙවා මීට පෙර ප්‍රසිඛකරණලදී.—වර්‍ෂ 1917ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දින නොම්මර 6,897 දරණ ගැසට් පත්‍රය සහ වර්‍ෂ 1918ක්වූ පෙබරවාරි මස 15වෙනි දින නොම්මර 6,925 දරණ ගැසට් පත්‍රය බලනු.

* මෙම ඉඩම් විකුණන්නේ මෙහි කියන පොරොන්දුපිටය.—අසිතිකාරයා හෝ අසිතිකාරයෝ ආණ්ඩුව විසින් යම් කලකදී නියමකරන බද්දගෙවන්ට ඔනෑය. නාච්චාදුව යටතේ දැනට තිබෙන අනිත් ඉඩම්වලට වඩා බදු වැඩිකරන්නේ නැත කියා ආණ්ඩුව පොරොන්දුවකින් බැඳෙන්නේ නැත. දැනට මෙම ඉඩම්වලට වැඩකළ කන්නට අක්කරේට රුපියල් 2 බැගින් ගෙවිය යුතුසි. වතු ඉඩම්වලට අවුරුද්දකට රුපියල් 3 බැගින් ගෙවිය යුතුසි.

*l* මෙය මීට පෙර ප්‍රසිඛකරණලදී.—වර්‍ෂ 1916ක්වූ සැප්තැම්බර් මස 1වෙනි නොම්මර 6,821 දරණ ගැසට් පත්‍රය බලනු.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ උතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 18වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ෂ.

---

වර්‍ෂ 1918වේ ජූනි මස 7වෙනි දින නොම්මර 6,948 දරණ ගැසට් පත්‍රයේ පෙනියන උතුරු මධ්‍යම දිසාවේ නොම්මර 2,038වේ ඉඩම් විකිනීමේ නොතිසියේ සඳහන් කනදරකෝරලේ කරඩික්කුලම යන ගමේ නොම්මර 5,026 මුල් සිතියමේ නොම්මර 7තේ බිම්කැටිටියේ අක්කරයක මිල රු. 15·50 නොව රු. 17·50 බව මෙසින් දන්වන්ට යෙදුනා ඇත.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 15වෙනි දින
අනුරාධපුරේ කච්චේරියේදිය.

ගොඩ්වින් ද ලිවේරා,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

---

**No. 1,271, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 1වෙනි දිනවූ බ්‍රහස්පතින්දා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුනන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ යටිකිඳ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 5ක්.

සිතියම 20. ගම—යටිකිඳ බෝගොඩකෝරලේ හාලිඇල්ලේගම. අසිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 8*y* | හුරීයහෙලගල්කබරගොඩ .. | රෙක්කතැන්නවත්තේ ජැක්රේ මහතා .. | පතන .. | 0 | 0 | 16 |
| 8 | එම .. | එම .. .. | එම .. | 43 | 0 | 7 |
| .3*b* | වටගොඩපිටිය .. | එම .. .. | එම .. | 1 | 1 | 13 |
| 3*b*2 | එම .. | එම .. .. | එම .. | 0 | 2 | 17 |
| :8*b* | උඩගෙදරලන්ද හෝම්පොලපතන.. | එම .. .. | එම .. | 0 | 2 | 28 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකෙට බදුදෙනු ලැබේ.

(*b*) මෙම ඉඩම් එකින් එකට "පිරිමියම්" මුදල්නම් රුපියල් 8, රුපියල් 264, රුපියල් 16, රුපියල් 8 සහ රුපියල් 8වේ.

(*c*) මෙම ඉඩම්වලට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකටවුවත් රුපියල් 3ක් වේ.

(*d*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක්වේ.

(*e*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පල ...රණු ලැබේ.

(*g*) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනු ලැබේ.

(*h*) ඉඩම තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුසි.

(*i*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් ...වුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුසි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස ...ැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*j*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිවාවූ බදු මුදලින් භාගයකට ...ැඩිනොවේ.

(*k*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර ...මට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් සම්බන්ධ කාරණ ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේ...ගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ෂ.

**No. 1,272, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 2වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ වැල්ලවාය කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියම 1,935. ගම—වැල්ලවාය පලාතේ කන්දපල්ලකෝරලේ රනසිංහගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 8 | හුනුකැටඅගලේහේන | .. ආර්. අලගොහොපිල්ලේ | .. හේන | .. 3 2 27 |

බදු කොන්දේසි.

(*a*) හක්සේරු මුදලවන රුපියල් 28ක "පිරිමියම්" මෙන් මුදලපිට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් රුපියල් 3ක ගණනේ ඉහත සඳහන්වෙන ඉඩම සදාකාලිකේට බදු දෙනු ලැබේ.

(*b*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදුමුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*c*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*d*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පල කරණු ලැබේ.

(*e*) තේ සහ රබර් වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනු ලැබේ.

(*f*) ඉඩම තේ සහ රබර් වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*g*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දු වියයුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*h*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියාකෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිචාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(*i*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම සම්බන්ධ කාරනා ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,273, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 5වෙනි දිනවූ සඳුදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ වැල්ලවාය කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

මුල් සිතියම 1,962. ගම—වැල්ලවාය පලාතේ කන්දපල්ලකෝරලේ වෙලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වෙලේගමපතන | .. විහාරගලවත්තේ ජේ. ඩී. ඇස්. වික්‍රමසිංහ මහතා | .. පතන සහ කැලේ | .. 11 2 18 |
| 2 | එම | .. ජේ. සී. ලංකාතිලක රටේමහත්මයා | .. එම | .. 10 3 21 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකලිකේට බදුදෙනු ලැබේ.

(*b*) මෙම ඉඩම් එකින්එකට "පිරිමියම්" මුදල් රුපියල් 63, රුපියල් 58ක් වේ.

(*c*) නොම්මර 1කේ බිම්කට්ටියට අවුරුද්දකට බදුමුදල රුපියල් 27ක්වේ.

(*d*) නොම්මර 2කේ බිම්කට්ටියට අවුරුද්දකට බදුමුදල රුපියල් 25ක් වේ.

(*e*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*g*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පල කරණුලැබේ.

(*h*) නොම්මර 1කේ බිම්කට්ටිය එලවළු වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි, එලවළු වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*i*) නොම්මර 2කේ බිම්කට්ටිය ගෙයක් සෑදීමටද ඉතුරු ඉඩම පලතුරු වැවීමටද පාවිච්චිකළ යුතුයි.

(*j*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*k*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙවිචාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(*l*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරනා ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස් පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 980, P. of S.**—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ ජූලි මස 29වෙනි දිනවූ සඳුදා පස්වරු 1ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කුවේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 13ක්.

සිතියම 2,711. ගම—වලවිට, කුරුවිටිකෝරලේ. අයිතිකමකියන්නා—සී. ඩී. ස්ටෝරර් මහතා සහ තවත් අය.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රූ. |
|---|---|---|---|---|---|
| 3 | කජුගස්වත්ත | .. — .. | .. අවුරුදු 5ගේ සිට 10 දක්වා වයසැති පොල් තිබෙන ඉඩම | .. 1 1 13 | 150* |
| | සිතියම 2,707. ගම—පත්නිල, අටකලන්කෝරලේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | තෙළුකැම්බේහේන | .. ඇම්. ඇල්. මොහොට්ටිහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් කැබෙල්ල | .. අල ඉරිඟු යනාදිය වවාතිබෙන ඉඩම | 0 2 16 | 20* |

* මෙම ඉඩම මිට ප්‍රථමත් විකිණීමට ප්‍රසිඩකරනලදී.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | කෙළකැටියන්වත්ත | .. ඇම්. ඇල්. පුංචිඅප්පුහාමි විසින් ආණ්ඩු කෙරෙන් අල්ලාගත් කැබෙල්ල | අවුරුදු 2ක් සිට 5 දක්වා වයසැති පොල් පුවක් යනාදිය වවා ති බෙන වත්ත .. | .. 0 2 3 | 35* |

සිතියම 38. ගම—හිරිඇල්ල, හවුපත්කෝරළේ.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 13අ | කුඹගෙදරගෙවත්ත | .. හිරෝහිනා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම් කැබෙල්ල .. | .. අවුරුදු 4ක් පමණවූ පොල් | .. 0 3 14 | 100* |

සිතියම 2,721. ගම—අළුත්නුවර, කඩවත්කෝරළේ.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | බෝකොලකුඹුරේගොඩවත්ත | .. නොම්මර 210,471 දරණ බිම් කට්ටියේ ඊරුම්ක්කාරයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම් කැබෙල්ල | .. අවුරුදු 6ක් පමණවූ තේ | .. 0 0 8 | 400 |
| 2 | බෝකොලකුඹුරේගොඩදෙනියාය | ඩබ්ලිව්. ඒ. ඩී. ජුවන්අප්පු | .. ලන්ද .. | .. 1 0 10 | 50 |
| 3 | බෝකොලකුඹුරේගො.ඩවත්ත | .. නොම්මර 210,471 දරණ බිම්කට්ටියේ ඊරුම්ක්කාරයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | .. අවුරුදු 6ක් පමණවූ තේ | .. 0 2 22 | 400 |
| 4 | පාර සහ එය ආරක්ෂකබිම | .. — .. | .. පරණ පාර සහ ආරක්ෂකබිම (ලන්ද) | 0 0 15 | 50 |

සිතියම 2,725 ගම—තිඹොල්කැටිය, අටකලන්කෝරළේ.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | කඹලගොඩයාය | .. — .. | .. ලන්ද .. | .. 0 0 36 | —† |
| 3 | එම | .. ඇල්. සාමිඅප්පු විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | .. වත්ත .. | .. 0 1 1 | 30* |
| 4 | එම | .. ජ්. සාන්තුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | .. එම .. | .. 0 3 0 | 30* |
| 5 | එම | .. — .. | .. අඩිපාර සහ ආරක්ෂක බිම | .. 0 0 28 | —‡ |
| 6 | එම | .. ක්. කළුඅප්පු විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | .. වත්ත .. | .. 1 2 14 | 30* |
| 7 | එම | .. කේ. මෝහනාච්චිලැමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | .. එම .. | .. 1 0 12 | 30* |

සිතියම 100 ගම—මුඳුතොට, කොලොන්නාකෝරළේ.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 18අ | අඹගස්බර්ත්වත්ත | .. නොම්මර 153,400 දරණ බිම්කට්ටිය අයිතිකාරයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල.. | අවුරුදු 10ක් සිට 15 දක්වා වයසැති .. තේ ජාවක දඩම් | .. 1 1 34 | 200 |

*ගෙවීම් ඉඩම් වට් ප්‍රථම විකිණීමට ප්‍රසිද්ධ කරණලදි. † පාර ආරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ.
‡ පාර සහ පාර ආරක්ෂක බිම්කැබෙල්ල, විකුණනු නොලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිවේ.

වර්‍ෂ 1918ක්වූ ජූනි මස 14වෙනි දින කොළඹ
මහලේකම්තුමාගේ උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තුමාගේ වෙනුවට.

---

No. 981, P. of S.—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1918ක්වූ අගෝස්තු මස 5වෙනි දිනවූ සඳුදා පැවරූ 10ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදී තිබේ ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

සිතියම 2,630. ගම—මුලත්ගම, මැදකෝරළේ. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
